ශීර්ෂය 310 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ (විෂය අංක 31001) අයවැය ඇස්තමේන්තුව මඟින් අනුමත කර තිබුණු අවම බැර සීමාව වූ රු.16,000,000 ක අගය රු.13,000,000 ක් දක්වා සංශෝධනය කර ගැනීමට අංක MUDC&H/2024/AD/B/01 දරන ලිපිය මඟින් ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කර තිබුණු සැසඳුම් ප්‍රකාශයේ අනුමත ප්‍රතිශෝධිත අවම බැර සීමාව රු.14,000,000 ක් ලෙස අනුචිතව දක්වා තිබුණි.	අවම ලැබීම් සීමාව රු.13,000,000 ක් ලෙස සංශෝධනය කිරීමට ඉල්ලීම් කර තිබුණ ද විගණනයට ඉදිරිපත් කර තිබුණු සැසඳුම් ප්‍රකාශයේ ලැබීම් සීමාව රු.14,000,000 ක් ලෙස දැක්වීම අත්වැරදීමකින් සිදු වී ඇති අතර නිවැරදි කර ගැනීමට සටහන් කර ඇත.	නියමිත කාල පරාසයන් තුළදී සීමා සංශෝධන අනුමැතිය ලබාගත යුතු අතර සැසඳුම් ප්‍රකාශයේ අනුමත සීමාවන් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.
ii.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 14.9 ඡේදය පරිදි අත්තිකාරම් අය කිරීම් හා මාසික පොලිය වාර්තා කොට තැබීම සඳහා පවත්වා ගෙන යන CC10 ලේඛනයෙහි ණය වාරිකවලට අදාළ එක් එක් මාසවල පොලී ගණනය කර දක්වා නොතිබුණු අතර ණය හා පොලී අයකිරීම්වල එකතුවද දක්වා නොතිබුණි.	නිසි පරිදි ණය මුදල් හා පොලී මුදල් අය කර ඇති නමුත් එය CC10 ලේඛනයෙහි නිසි පරිදි යාවත්කාලීන කිරීමට අතපසු වී ඇති අතර එය ඉදිරියේදී යාවත්කාලීන කර නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කරනු ඇත.	ණය ලේඛන නිසි පරිදි මාසික ණය වාරික සහ පොලී වටිනාකම් සහිතව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
iii.	ණය අත්තිකාරම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරනු ලබන නිලධාරීන්ගේ නම, වැටුප් අංකය, ඉල්ලීම් කළ දිනය, ඉල්ලීම් කරන ලද කාරණය හා ණය මුදල ඇතුළත් පොරොත්තු ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගත යුතු වුවත් එවැනි ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි.	අත්තිකාරම් ලබා දීමට අදාළව පොරොත්තු ලේඛනයක් දැනටමත් පවත්වාගෙන යනු ලබන අතර එය 2025 අප්‍රේල් 08 දින විගණන කාර්යාලය වෙත යවා ඇති අතර විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි නඩත්තු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	ණය ඉල්ලුම්පත්වල විස්තර ඇතුළත් පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

(ආ) කළ වැඩ අත්තිකාරම් ගිණුම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ණයගැති වැඩිපුර ලැබීම් ගිණුමේ වර්ෂය ආරම්භයේ පැවති රු.16,892,320 ක ශේෂයෙන් වර්ෂය අවසානය වන විට රු.3,458,808 ක ණයගැති වටිනාකමක් නිශ්චිතව හඳුනා ගෙන නිසි පරිදි ගිණුම්ගත කර තිබුණු අතර රු.13,433,512 ක ශේෂයක් හඳුනා ගෙන නොතිබුණි.	මේ දක්වා හඳුනා නොගත් රු.13,433,512 ක ශේෂය හඳුනා ගැනීමට කටයුතු කරමින් පවති.	ලැබීම් ශේෂයන් නිසි පරිදි හඳුනාගෙන අදාළ ගිණුම්වලට පිටපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	2022 හා 2023 වර්ෂවල විකුණුම් ආදායම ගණනය කිරීමේදී අත්හැරී තිබුණු රු.4,177,300 ක් වටිනා විකුණුම් ඉන්වොයිස් 06 ක් පෙර වර්ෂ ලාභයට ගැලපීම වෙනුවට මෙම වසරේ විකුණුම්වලට ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	අතපසුවීමක් හේතුවෙන් පෙර වර්ෂ ලාභයට ගැලපීමක් නොකර අදාළ වර්ෂයේ විකුණුම්වලට ගැලපීම් කර ඇත.	විකුණුම් ආදායම් නිසි කාල පරිච්ඡේදය අනුව ගිණුම්ගත කර ලාභ අලාභ නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ රු.19,615,678 ක මුදලට විකුණුම් ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් එම අගයෙන් ණයගැති ශේෂයන් වැඩියෙන් දක්වා තිබුණි.	ඉන්වොයිස් අංක 2/7914 සහ 2/7751 අතපසු වීමකින් ණයට විකුණුම්වල ඇතුළත් වී ඇති නමුත් ඉදිරියේදී ණයට විකුණුම් හා මුදලට විකුණුම් අදාළ පරිදි ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.	මුදලට සහ ණයට විකුණුම්, නිවැරදිව ගිණුම්ගත කර සත්‍ය ණයගැති ශේෂය පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(iv)	ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රකාර අදාළ වර්ෂයේදී ගනුදෙනුකරුවන් වෙත නිමකර භාරදුන් භාණ්ඩ හා ව්‍යාපෘති වියදම් පිරිවැටුම ලෙස සලකනු ලැබුවද නිම නොවූ ව්‍යාපෘති 04 ක් ඉටු කිරීම වෙනුවෙන් රු.61,056,929 ක ඉන්වොයිස් නිකුත් කර එම වටිනාකම ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කොට තිබුණි. මෙම කාර්යයන් ගිණුම් වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් අත්තිකාරම් ලෙස ලබා ගත් රු.40,765,416 ක මුදල විකුණුම් ගිණුමෙන් ඉවත් කොට අත්තිකාරම් ගිණුමට බැර කොට තිබුණි. ඉතිරි විකුණුම් වටිනාකම වූ රු.20,291,513 ක් අදාළ ගිණුම් තුළින් ඉවත් කළ බවට සාක්ෂි නොවිය.	කළ වැඩ අත්තිකාරම් ගිණුමේ සටහන 11 ට අනුව රු.40,765,416 ක් ලෙස සඳහන් වටිනාකම වන්නේ 2024 වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද ඉන්වොයිස් වටිනාකම වූ රු.61,056,929 න් 2024 වර්ෂය තුළ නිමකිරීමට නොහැකිව 2025 වර්ෂයට ගෙනයනු ලබන වැඩපත්වල වටිනාකම වේ. මෙහිදී මෙම වැඩපත් 2025 තුළදී ද සිදුකිරීමට නියමිත අළුත්වැඩියාවන් හෝ නඩත්තු වෙනුවෙන් ඉදිරියට ගෙනයනු ලබන අතර, සටහන 11 හි සඳහන් පරිදි එය අත්තිකාරමක් නොව මෙම වසරේ පිරිවැටුමෙන් ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වන බැවින් එම වටිනාකම පමණක් විකුණුම්වලින් ඉවත්කර ඇති අතර, රු.20,291,513 ක වටිනාකම් විකුණුම් තුළ ඇතුළත් කර ඇත.	වර්ෂයට අදාළ ආදායම නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(v)	පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීම් පිණිස පෙර වර්ෂ ගැලපුම් යටතේ රු.19,916,346 ක් සමුච්චිත ලාභයට ගැලපුම් කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 54 වගන්තිය ප්‍රකාරව ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි සඳහන් පරිදි හෙළිදරව් කිරීමේ ප්‍රකාශයක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති ප්‍රකාරව පෙර වර්ෂ ගැලපුම් මූල්‍ය ප්‍රකාශනයන්හි නිසි පරිදි හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(vi)	ගෙවීම් විශ්ලේෂණය අනුව 2024 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම් වටිනාකම රු.1,310,015 ක් වුවද එය රු.1,296,368 ක් ලෙස අතිකාල ගෙවීම් ගිණුමට පිටපත් කිරීම හේතුවෙන් අතිකාල වියදම් රු.13,641 කින් අඩුවෙන් දක්වා තිබුණි.	තොරතුරු සෙවීම සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් තොරතුරු සොයා කඩිනමින් ඉදිරිපත් කරනු ඇත.	වියදම් නිවැරදිව ගිණුම්වල පිටපත් කිරීමට කටයුතු කළ යුතුය.
(vii)	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂයන්හි එකතුව රු.36,941,553 ක මුදලින් රු.4,045,992 ක මුදලක් පමණක් අමාත්‍යාංශ ලේකම්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් කපා හැරීම සඳහා අනුමත කර තිබුණද ඊට පටහැනිව රු.36,941,553 ක මුළු ණය ශේෂයම කපා හැර තිබුණි.	2008 හා 2009 වර්ෂවලට අදාළව ණයගැතියන්ගෙන් කපාහරින ලද රු.36,941,554 ක ශේෂය සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කිරීමට කටයුතු කර ඇත.	නිසි පරිදි අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් ණයගැති ලියා හැරීම් සඳහා කටයුතු කළ යුතුය.

(ඇ) ගබඩා අත්තිකාරම් ගිණුම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මු.රෙ. 501 ප්‍රකාරව ගබඩා අත්තිකාරම් ගිණුම පවත්වා ගනු ලබන්නේ ලාභ උපයන අදහසින් හෝ පාඩු අපේක්ෂාවෙන් නොවන අතර, භාණ්ඩ ගෙන එනු ලබන මිලට භාණ්ඩ තොගය ගණන් ගනු ලබයි. ඒවා මිලදී ගැනීමට ගබඩා කිරීමට හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය වන පරිදි පිරිවැයට සියයට 8 ක් එකතු කර තොග නිකුත් කරනු ලබන බව 2024 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ පෙරවදනෙහි දක්වා තිබුණි. වර්ෂයේ නිකුත් කිරීම්	නිකුත් කිරීම්වලට අදාළ සියයට 8 ක අගය තුළින් ප්‍රධාන ගබඩාවේ සේවක වියදම හා සැපයුම් වියදම ආවරණය වීම ප්‍රමාණවත් නොවූ බැවින් 2024 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ හටගත් ඌනතාවය කළවැඩ අත්තිකාරම් ගිණුමට මාරු කර ඇත.	ලාභ හෝ අලාභ ඇති නොවන අයුරින් ගබඩා අත්තිකාරම් ගිණුම මෙහෙයවිය යුතුය.

	වලින් නිකුත් කිරීමේ පිරිවැය රු.67,342,343 ක මුදල හා රු.9,031,952 ක සේවක වියදම් හා සැපයුම් වියදම් අඩුකළ පසු රු.4,177,325 ක ඌනතාවයක් ගිණුම් මඟින් දක්වා තිබුණි.		
(ii)	සමාලෝචිත වර්ෂයේ ලැබීම් හා නිකුත් කිරීමේ ගිණුමේ අලාභය වූ රු.4,177,325 ක අගය ශේෂ පත්‍රයේ රු.3,209,322 ක් අලාභයක් ලෙස රු.968,003 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023 වර්ෂයේ ප්‍රධාන ගබඩාව සඳහා භාණ්ඩාගාර අක් මුදල් හරහා මිලදී ගත් බදු රහිත රු.968,003 ක ගැණුම් 2023 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ ණයහිමියන් හා ගැණුම් ලෙස සටහන් වීමේ වරද 2024 වර්ෂයේ වියදම ඉක්මවූ නිකුත් කිරීමේ ගිණුම හරහා නිවැරදි කළ අතර එම නිවැරදි කිරීමේ ජ'නල් සටහන නිසා ලැබීම් හා නිකුත් කිරීමේ ගිණුමේ අගය හා ශේෂ පත්‍රයේ ශේෂය අතර රු.968,003 ක වෙනසක් පෙන්වා ඇත.	මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම් ශේෂ අතර වෙනස්වීම් සංසන්දනය කර නිවැරදි ශේෂ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ස්ථාවර වත්කම් ලේඛනය**		
	2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මඟින් වත්කම් ලේඛනය පිළියෙල කර යාවත්කාලීන කර නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.	සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මඟින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(ii)	**තොග පොත**		
	මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව තොග පොත් යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

(iii) **හානි පිළිබඳ ලේඛනය**

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	පරීක්ෂා කර බලා අඩුපාඩු සම්පූර්ණ කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය.

(iv) **බැරකම් පිළිබඳ ලේඛනය**

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේ දී යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.

(ඉ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ, මෝටර් රථ ක්ෂය කිරීම්, යන්ත්‍රෝපකරණ, යන්ත්‍රෝපකරණ ක්ෂය කිරීම් හා ක්ෂය සංචිත අරමුදල් වටිනාකම් පිළිවෙලින් රු.70,508,827, රු.120,429, රු.354,294,760, රු.6,525,302 හා රු.1,682,924 ක් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සඳහා අදාළ විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.574,183,874 ක ණයගැති ශේෂය සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.	මෙම වටිනාකමට අදාළ ණයගැතියන් වෙත ලිපි මඟින් දන්වා ශේෂ සනාථ සහතික ලබා ගැනීමට කටයුතු කරන අතර ඉන්පසු විගණනයට ඉදිරිපත් කරනු ඇත.	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් සඳහා නිවැරදි විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂය තුළ මු.රෙ. 503(1) ප්‍රකාරව ගැලපීම් කිරීමට අදාළව ගෙවීම් රු.36,010,388 ක් සහ ලැබීම් රු.7,838,301 ක් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.	විගණනය විසින් මෙම වටිනාකම් ලබාගත් ආකාරය පැහැදිලි නොවන අතර මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සීමා සංශෝධන අමාත්‍ය මණ්ඩල සංදේශයේ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කර ඇත.	මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන ලද ගැලපීම්වලට අදාළ නිවැරදි විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට සහ

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණු බවට

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1(ආ) (ii)	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂවල එකතුව රු.36,941,553 ක් වුවද ලියා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු.4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.	1.6.1(ආ)(vii)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 06 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 3.4 වගන්තිය අනුව එක් එක් වැය විෂය සංකේතයන් යටතේ සෑම වැය විෂයක්ම වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනස එම වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 හෝ රු.10,000 යන අගයන් දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වඩා වැඩි වන්නේ නම් එම වෙනසට හේතු ඒ.සි.ඒ. 2(ii) ආකෘතියෙහි දැක්විය යුතු වුවද එසේ දක්වා නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.	අපේක්ෂිත වියදම් සඳහා ඇස්තමේන්තු කරන ලද නමුත් අපේක්ෂිත පරිදි ගෙවීම් සඳහා වවුචර්පත් ඉදිරිපත් කර නොමැත.	ගිණුම් මාර්ගෝපදේශ අනුව වැය විෂයයන්හි ඉතිරිවීම් සඳහා හේතු දැක්වීමට කටයුතු කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි බැරකම් වාර්තා කර නොතිබුණද	කළමනාකරණ කටයුතු සිදු කිරීමේදී 2024 නොවැම්බර් මස යාවත්කාලීන කොට ලබාදුන් මූල්‍ය ප්‍රගති වාර්තා	මූල්‍ය ප්‍රකාශනවල බැරකම් නිසි පරිදි වාර්තා කිරීමට කටයුතු

	රු.2,866,424 ක අගයකින් සමාලෝචිත වර්ෂය අවසානයේ බැරකම්වලට එළඹ තිබුණි.	අනුව ඉදිරි මිලදී ගැනීම් සිදු කරනු ලබන අතර විගණන නිර්දේශ අනුව ඉදිරියේදී මෙම කටයුතු කිරීමට බලාපොරොත්තු වනු ඇත.	කළ යුතුය.
ii.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94(1) රෙගුලාසිය ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු බව දක්වා ඇතත් නිසි අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා වැය විෂයන් 06 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා රු.1,535,278 ක බැරකම්වලට එළඹ තිබුණි.	විගණන නිර්දේශ අනුව ඉදිරියේදී මෙම කටයුතු කිරීමට බලාපොරොත්තු වනු ඇත.	ප්‍රතිපාදන පිළිබඳව නිසි අධ්‍යයනයක් කර මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් වලට එළඹීමට කටයුතු කළ යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම ආයතනයේ මූල්‍යය පාලනය සම්බන්ධයෙන් සඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස්කර ඇති අතර එය කාර්තුගතව සමාලෝචනය ලිඛිතව සිදු කිරීම සඳහා විගණන කළමනාකරණ කමිටු හරහා කටයුතු කරනු ලබන අතර ඒ පිළිබඳ ප්‍රගතිය විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර පාලන පද්ධතිය ලිඛිතව සමාලෝචනය කර එහි පිටපතක් විගණකාධිපතිට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදයේ 6.4 ඡේදය	-	සංහිඳ සෙවණ මහල් නිවාස සංකීර්ණයේ නිවාස 60 කින් යුත් මහල් 06 ක් පරීක්ෂා කිරීමේදී නිවාස වසා දැමීම නිසා නිවාස 33 ක් පරීක්ෂා කර නොතිබුණු අතර පරීක්ෂා කළ නිවාස 27 න් නිවාස 06 ක් කුලියට ලබා දී ඇති බව නිවාස පරීක්ෂණ මණ්ඩලය වාර්තා කර තිබුණි. නිවාස අතුරු බදු දීම, මුදල් ගෙවා නවතින අමුත්තන් සහ නේවාසිකයන් තබා ගැනීම ද තහනම් බව අදාළ රෙගුලාසියේ දක්වා ඇතත් නිවාස කුලියට ලබා දී තිබුණු නිලධාරීන් අතරින් නිලධාරීන් තිදෙනෙකු විගණිත දිනය වූ 2025 ජනවාරි 20 දින දක්වාම නිවාස පදිංචියෙන් ඉවත් කර නොතිබුණි.	කුලියට ලබා දී ඇති නිවාසවලින් තව දුරටත් පදිංචිව සිටින සේවක මහතුන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.	අදාළ රෙගුලාසිය පරිදි කුලියට ලබාදුන් නිවාස සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
(i)	මුදල් රෙගුලාසි අංක 504 (1)	-	දෙපාර්තමේන්තුව විසින් එක් එක් කාර්තුව අවසානයේදී වෙළඳ ණයගැතියන් සහ ණයහිමියන්, නිමි	ඉදිරියේ දී කාර්තුගතව වෙළඳ ණය හිමියන්, ණය ගැතියන්, නිමි භාණ්ඩ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් හා අත්තිකාරම්	මුදල් රෙගුලාසි ප්‍රකාරව සීමාවන් පිළිබඳ කාර්තුමය ප්‍රකාශනයන්

			භාණ්ඩ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් සහ අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් පිළියෙල කර විගණකාධිපති වෙත ද පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් විගණකාධිපති වෙත පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ඇත.	පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි අංක 756 (6)	-	පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර වර්ෂයේ 2023 අපහරණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	2022 හා 2023 වර්ෂවලට සමීක්ෂණ මණ්ඩල මඟින් විකිණීමට නිර්දේශිත වත්කම් ලැයිස්තුවෙහි සඳහන් වත්කම් විකිණීම් කටයුතු සඳහා සූදානම් කර තිබුණ ද 2023 මැයි 16 දිනැති අංක අමප/23/0783/608/057 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අපහරණ කටයුතු කිරීමට බාධාවක් පවතින්නේද යන්න කොම්ප්ට්‍රෝලර් ජනරාල් විමසන ලද නමුත් ඒ පිළිබඳ උපදෙස් ලබා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2025 වර්ෂයේදී ඉහත වර්ෂවලට අදාළ භාණ්ඩ විකිණීම් කටයුතු සිදුකර ඇත.	මුදල් රෙගුලාසිවල සඳහන් කාල රාමුවට අනුව භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017 ජුනි 28 දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	-	වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	වාහන සම්බන්ධව කොම්ප්ට්‍රෝලර් ජනරල් විසින් හඳුන්වා දී ඇති NFAMS මොඩියුලය 2024 දෙසැම්බර් 31 දිනට යථාවත් කර ඇත. ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ සම්බන්ධ තොරතුරුවල දෘඩ පිටපත් එවීම අවශ්‍ය නොවන බවටත් මොඩියුලයක් හඳුන්වාදීමට කටයුතු කරන බවත් වාචිකව දැනුම් දී ඇත.	චක්‍රලේඛය අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

3.5 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වසර දෙකකට වඩා වැඩි කාලයක් තුළ නිරවුල් නොවූ කොන්ත්‍රාත් රඳවුම් මුදල් තැන්පතු ශේෂය රු.616,800 ක් හා තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීමට තාවකාලිකව රඳවා ගත් තැන්පතු ශේෂය රු.3,610,228 ක් සම්බන්ධයෙන් මු.රෙ.571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම රඳවුම් මුදල් සම්බන්ධයෙන් මු.රෙ.571(3) ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දෙවන මහලේ වහල පිළිසකර කිරීමේදී වඩා අවදානම් සහිත ස්ථාන ගලවා දිරාගිය කොටස් ඉවත් කර අලුත්වැඩියාව සම්පූර්ණ කර ඇති බවත් එම ප්‍රමාණය එකඟ වූ වැඩ කොටසෙන් සියයට 25 ක් පමණ බවත් සඳහන් කරමින් 2024 නොවැම්බර් 28 දක්වා සිදු කරන ලද වැඩ කොටසට අදාළව රු.3,780,162 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සියයට 20 ක අත්තිකාරම් මුදලක් ලබා ගත හැකිව තිබියදීත් එසේ ලබා නොගෙන දෙපාර්තමේන්තුව මුදල් යොදවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඉටු කරන ලද වැඩ කොටස් වෙනුවෙන් ලැබිය යුතු මුදල 2025 ජනවාරි මස වන විටත් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.	මෙම වහලයේ කටයුතු වහලයේ තිබූ අවධානම් තත්ත්වය ද සෞඛ්‍ය අමාත්‍යාංශය රාජ්‍ය ආයතනයක් බැවින් ද සළකා මෙම වහලයේ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කළ අතර ගෙවීම් ලබා ගැනීමට අඛණ්ඩව සිහිකැඳවීම් කරනු ඇත.	ලැබිය යුතු ආදායම් කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ඉදිකිරීම් ආරම්භයේදී අත්තිකාරම් මුදල් ඉල්ලුම් කර මූල්‍ය දුෂ්කරතා වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 දින රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා තවත් රු.10,710,572 ක් 2019 මාර්තු 14 දින හා රු.7,694,000 ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572 ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 10 ක පමණ පහළ මට්ටමක පැවතුණි. ඉදිකිරීම් ආරම්භ කර වසර 06 ක කාලයක් ගත වුවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල ඉදිකරන ස්ථානය පිළිබඳව ඉදිකරන කාලය පිළිබඳව නිශ්චිතව උපදෙසක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා නිශ්චිතව දන්වා නොමැත. එබැවින් මේ සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අදාළ ඉදිකිරීම ඔවුන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සිදු කිරීමට කටයුතු කරනු ඇත.	ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ නොපමාව කටයුතු කළ යුතුය.

4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව	ඉදිරියේදී මෙම සිදු වූ ප්‍රමාදය සිදු නොවීමට කටයුතු යොදා ඇති අතර, නියමිත කාලරාමුව තුළදී මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	නීතිරීති විධිවිධානයන්ට අනුකූලව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රජයේ කර්මාන්තශාලාවේ නිෂ්පාදිත භාණ්ඩ ප්‍රදර්ශණය කිරීම සඳහා කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිරිපස ඉදිකර තිබුණු වර්ග මීටර් 265 කින් යුත් ප්‍රදර්ශණාගාරය ඒ සඳහා උපයෝගී කර ගැනීමට කටයුතු නොකර දීර්ඝ කාලයක සිට වසා දමා තිබුණි.	ප්‍රදර්ශනාගාරයට ප්‍රදර්ශන භාණ්ඩ ඇතුළත් කර නිලධාරියෙකු ද නම්කර ඇත. සේවක හිඟකම හේතුවෙන් නම් කරන ලද නිලධාරියාට තවත් කාර්යයන් පැවරීමට සිදුව ඇත. සේවක පුරප්පාඩු පිර වූ පසුව යථා පරිදි ප්‍රදර්ශනාගාරය විවෘතව තබා අදාළ කටයුතු කරගෙන යාමට හැකිවනු ඇත.	දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව සහ ඵලදායීව උපයෝජනය කළ යුතුය.
(ii)	කර්මාන්තශාලා භූමියෙහි පිහිටි පැරණි ආපනශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කර රාත්‍රි සේවක විවේකාගාරයක් ලෙස භාවිතා කිරීමට කළමනාකරණය විසින් නිර්දේශ කර තිබූ අතර 2023 වර්ෂයේදී අළුත්වැඩියා කටයුතු සඳහා වහලය ගලවා ඉවත් කර තිබුණි. මෙම ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා කටයුතු 2025 පෙබරවාරි 20 විගණන දින වන විටත් ආරම්භ කර නොතිබුණු අතර ගොඩනැගිල්ලෙහි බිත්ති වැස්සට තෙමීමෙන් හානියට පත්වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	ඒ ඒ වර්ෂයට ලබාදෙන ප්‍රතිපාදන අනුව කළමනාකරණය කර ගනිමින් මෙම ඉදිකිරීම සිදු කරන බැවින් ද සේවක වැටුප් හා දීමනා ගෙවීමට අදාළ ඉපයීම් ලබා ගැනීමට අවශ්‍ය වන කාර්යයන් වලට ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවන බැවින් ද මෙම ඉදිකිරීම ප්‍රමාද වී ඇති අතර මෙම ඉදිකිරීම කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ඇත.	ප්‍රතිපාදන වෙන් කර ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියාවන් ආරම්භ කරන තෙක් ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	දෙපාර්තමේන්තුව සතු රු.2,200,000 ක වටිනාකමකින් යුත් වාහන 03 ක් ගර්හිත තත්ත්වයේ පැවති අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතුව ගර්හිත තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීම සඳහා කටයුතු කරනු ඇත.	ගර්හිත වාහන කඩිනමින් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට පියවර ගත යුතුය.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මු.රෙ. අංක 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරින්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප අඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු බව දක්වා ඇතත් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ (පාලන), සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), ප්‍රධාන ඉංජිනේරු, ඉංජිනේරු, ප්‍රධාන ගණකාධිකාරි, ගණකාධිකාරි, ගබඩා භාරකරු හා රියදුරන් ඇප තැබීම් සිදු කර නොතිබුණි.	මේ පිළිබඳව සොයා බලා ඇප ප්‍රමාණයන් යෝජනා කර අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතියට ඉදිරිපත් කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ නිලධාරීන් ඇප තැබීම් සිදු කළ යුතුය.

4.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදී සොරුන් වැඩහල් භූමියට ඇතුල් වී වැඩහල් අංක 11 (වර්තමාන වැඩහල් අංක 16) හි ඉලෙක්ට්‍රික් උපකරණ හා භාණ්ඩ සොරා ගෙන ගොස් තිබූ බව වාර්තා කර තිබුණි. 2024 ජුනි 15 දින රාත්‍රී භාණ්ඩ හා උපකරණ සොරා ගැනීමෙන් පසු ආයතනයේ ආරක්ෂාව තර කිරීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් නැවත 2024 ජුනි 17 දින රාත්‍රියේදී ද සොරුන් ආයතනයට ඇතුල්වී භාණ්ඩ සොරා ගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය. දින දෙක තුළදී සොරා ගත් බවට හඳුනා ගෙන තිබූ උපකරණවල වටිනාකම රු.263,842 ක් බවට තක්සේරු කර තිබූ අතර ආයතන පරිශ්‍රයේ	හඳුනාගත් සියළු භාණ්ඩ ඇස්තමේන්තු කර අලාභය ආරක්ෂක ආයතනය මඟින් අයකර ගැනීමට කටයුතු කර ඇත. සොරකම සිදුවූ අවස්ථාවේදී අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.	දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත පද්ධති මනා ලෙස ක්‍රියාත්මක කළ යුතු අතර සිදුවූ අලාභ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතුය.

	අනාරක්ෂිතව හා ලේඛන ගත නොකර තිබූ උපකරණ සොරුන් රැගෙන යාමෙන් ආයතනයට සිදුව තිබූ අලාභය ගණනය කිරීමට නොහැකිව තිබුණි.		
(ii)	2024 ඔක්තෝබර් 22 දින කර්මාන්තශාලාවේ ප්‍රදර්ශනාගාරයෙහි ඉදිරිපස වීදුරුව බිඳ දමා සොරුන් ප්‍රදර්ශනාගාරයට ඇතුළුවී වටිනා භාණ්ඩ හා උපකරණ සොරා ගෙන ගොස් තිබුණි. මේ සම්බන්ධයෙන් මු.රෙ. 103(1) හා මු.රෙ. 104(1) යටතේ කටයුතු කර නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. එකම වර්ෂයේ අවස්ථා තුනක දී ආයතනයේ භාණ්ඩ සොරා ගැනීම සිදු කර තිබුණු බැවින් ඒවා වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක ක්‍රියා මාර්ග අනුගමනය කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.	මුරෙ 103(1) හා මුරෙ 104(1) යටතේ කටයුතු කෙරෙමින් පවති.	අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදු කිරීමට සහ සොරකම් වළක්වා ගැනීමට ආරක්ෂක කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.

4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ එක් එක් වැඩ ඒකකවල සේවකයින් බාහිර ආයතන වලින් ලැබෙන ඇණවුම් වැඩ ඉටු කිරීමට ඒ ඒ වැඩහල් වලින් ආයුධ හා උපකරණ මාර්ග පත්‍ර වල සටහන් තබා රැගෙන යාම කර තිබුණි. බාහිර ආයතනවල කාර්යයන් අවසන් වූ පසුව එම ආයුධ හා උපකරණ, කර්මාන්තශාලාව වෙත ආපසු භාර දීමට කටයුතු කළ යුතු වුවත් 2025 ජනවාරි 25 විගණිත දිනය වන විටත් ආපසු භාර දී නොතිබුණි.	මෙසේ භාරදීමට ප්‍රමාද වූ ආයුධ පිළිබඳ සොයා බැලීම හා ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරනු ඇත.	වැඩහල්වලට අයත් ආයුධ සහ උපකරණ ආපසු ලබා ගැනීමේ නිසි ක්‍රමවේදයක් සකස් කර අධීක්ෂණය කළ යුතුය.
(ii)	රජයේ කර්මාන්තශාලාව පවත්වාගෙන යනු ලබන කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩමට අදාළ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාළ හිමිකම් සහතික හෝ ඔප්පු ලබා ගෙන නොතිබුණි.	ඊට අදාළ මැනුම් කටයුතු සිදු කර අවසන්ව ඇති අතර, ඊට අදාළ ලේඛන සකස් කිරීම සඳහා අදාළ සියළුම ලියකියවිලි කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.	දෙපාර්තමේන්තුව සතු ඉඩම් සඳහා නීත්‍යානුකූල අයිතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(iii)	රජයේ කර්මාන්තශාලාවේ පැවති පැරණි පරිගණක මෘදුකාංග පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් අක්‍රමවත්ව ක්‍රියාත්මක වූ තොග පාලනය, තොග ඇණවුම් කිරීම, මිලදී ගැනිම්, ඇස්තමේන්තු සැකසීම ආදී කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා පැවති පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මිල ගණන් කැඳවා පුද්ගලික ආයතනයක් වෙත රු.2,954,700 ක් 2021 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. පරිසණක මෘදුකාංග පද්ධතිය මඟින් යලි ඇනවුම් මට්ටමේදී ගබඩා ඇනවුම ස්වයංක්‍රියව නිර්මාණය වී අනුමැතිය සඳහා ඉදිරිපත්වන බවට පිරිවිතරයන්හි දක්වා තිබුනද අතින් ලියන ලද ගබඩා ඇනවුම් මිලට ගැනුම් අංශයට ඉදිරිපත් කර තිබුණි.	මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමේදී දේශීය ඇණවුම් ක්‍රියාමාර්ගයේ විවිධ ගැටළු පවතින බැවින් වැඩි අවධානයක් යොමු කර දේශීය ඇණවුම් ක්‍රියාත්මක කිරීම යථා තත්ත්වයට පත්කර ගන්නා ලදී. ගබඩා ඇණවුම් නිතර ඉදිරිපත් නොවන අතර ඉදිරියේදී එයද යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.	පරිසණක මෘදුකාංග පද්ධතිය පිරිවිතරයන්ට අනුව කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය.
(iv)	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ හිඟ ණය ශේෂ අය කර නොගැනීම.**		
•	විශ්‍රාම ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් වර්ෂ 20 කට වැඩි කාලයක සිට අය විය යුතු රු.420,905 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.	විශ්‍රාම ගොස් වසර 20ට වැඩි කාලයක් අය නොවී පවතින රු.420,905 ක් වූ ණය ශේෂයන් අයත් නිලධාරීන් සිවුදෙනාගෙන් තිදෙනෙක් අනිවාර්ය විශ්‍රාම යවා ඇති අතර ඔවුන්ට 2025 වර්ෂයේ වයස අවුරුදු 55 සපිරෙන අතර එදිනට විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය මඟින් ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර අනෙක් ණය ශේෂය වන රු.116,305 ක් පොත් වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත.	හිඟ ශේෂයන් අයකර ගැනීමට ආදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර පාඩු අවම කර ගත යුතුය.
•	විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් රු.125,500 ක් හා රු.177,800 ක් වර්ෂ 1 - 5 දක්වා කාලයක් තුළ අය නොවී පැවතුණි.	ඔවුන්ට හිමි වීමට නියමිත සේවා පාරිතෝෂිකය මඟින් අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ඇත.	හිඟ ශේෂයන් අයකර ගැනීමට ආදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර පාඩු අවම කර ගත යුතුය.

• 2009 සහ 2023 වර්ෂවල වැඩ තහනමට ලක්ව තිබුණු නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.142,605 ක හා රු.27,640 ක ණය ශේෂයන් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වැඩ තහනමට ලක්ව තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් එක් නිලධාරියෙකුගේ ණය ශේෂය වන රු.142,500 ක් පොත් වලින් කපා හැරීමට කටයුතු කරමින් සිටින අතර අනෙක් රු.27,640 ක ණය ශේෂය නීති ක්‍රියාමාර්ග මඟින් අය කර ගැනීමට කටයුතු කරනු ඇත.	හිඟ ශේෂයන් අයකර ගැනීමට ආදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර පාඩු අවම කර ගත යුතුය.
• සේවය අතහැර ගොස් වසර 10 ට වැඩි කාලයක් ගත වූ නිලධාරින් 5 දෙනෙකුගේ එකතුව රු.242,500 ක ණය ශේෂයක් හා සේවය අතහැර ගොස් වසර 20 කට වැඩි කාලයක් ගත වූ සේවකයින් දෙදෙනෙකුගේ එකතුව රු.59,800 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සේවය අතහැර ගොස් වසර 10ට වැඩි කාලයක් ගත වූ නිලධාරීන් පස් දෙනාගෙන් අයවිය යුතු මුදලින් රු.137,400 ක මුදලක් පොත්වලින් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබමින් පවතින අතර අනෙකුත් ණය ශේෂ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ඇතැම් ණය ශේෂ කපා හැරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.	හිඟ ශේෂයන් අයකර ගැනීමට ආදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර පාඩු අවම කර ගත යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුළ තිරසර සංවර්ධන අරමුණු කිහිපයක් හඳුනාගෙන තිබුණද ඊට අදාළ දර්ශක නිශ්චිතව හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	තිරසර සංවර්ධන අරමුණු හා ඊට අදාළ දර්ශක හඳුනාගෙන ඇත.	අරමුණු, දර්ශක සහ ඉලක්ක නිසි පරිදි හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව් ඇති තනතුරු 477 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ මූල්‍යමය හැකියාව හා සේවා අවශ්‍යතාවය අනුව වරින්වර බඳවා ගැනීමට කටයුතු කරන අතර දැනට අංක 01/14/05/02 (අ.කා.තො.) දරන හා 2025 ජනවාරි 16 දිනැති බඳවා ගැනීමේ ලිපියෙන් කටයුතු කර ඇත.	පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවය මත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.